චක්‍රලේඛ අංකය -03/2024

මගේ අංකය -සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප.)
ආදිපාද වීදිය,
කොළඹ .01
2024.05.20

සීමා සහිත කොළඹ දකුණ සමුපකාර සමිතිය ඇතුළු
බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති වල හා ද්විතික සමිතිවල සභාපතිවරුන් වෙත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්/අනුකමිටු රැස්වීම් සඳහා දීමනා ගෙවීම හා සංයුක්ත දීමනා

උක්ත කරුණ සම්බන්ධයෙන් දැනටමත් නිකුත් කර ඇති 2019.04.22 දිනැති 2019/06 චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර 2024.06.01 සිට මෙම චක්‍රලේඛය බලාත්මක වේ.

සමුපකාර සංවිධාන සාමාජිකත්වය විසින් සියකැමැත්තෙන් ආරම්භ කර ක්‍රියාත්මක කරන සංවිධාන පද්ධතියක් වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්/කාරක සාභිකයින් ඇතුළු අනෙකුත් සභිකයින්ට තම සංවිධානය වෙනුවෙන් සාමාජිකත්වය ඉක්මවා ගිය කාර්යභාරයක් හා වගකීමක් පැවරෙන බැවින් සංවිධානයේ ඵලදායිතාවය සඳහා ඔවුන්ගේ දායකත්වය උපරිම අයුරින් ලබා ගැනීම සඳහා හා ඔවුන්ගේ කැපකිරීමට ඇගයීමක් ලබා දීම සඳහා පහත සඳහන් පරිදි දීමනා ගෙවිය හැකි පරිදි බස්නාහිර පළාතේ 2011 අංක 04 දරණ සමුපකාර සමිති(සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සම්පාදිත හෝ පිළිගත් හෝ සමුපකාර සමිති රීති වලින් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇති බලතල යටතේ මෙම චක්‍ර ලේඛණය නිකුත් කර ඇත.

## 01.අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දීමනා

I. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වීම සඳහා අධ්‍යක්ෂවරුන්ට යැපීම් දීමනා ඇතුලත්ව මාසිකව රු.7500 ක උපරිමයට යටත්ව එක් රැස්වීමක් සඳහා රු.2500/- බැගින් දීමනාවක් ලබාගත හැක.

II. එසේ වුවද, ද්විතික සමිතිවල අධ්‍යක්ෂවරුන්ට යැපීම් දීමනා ඇතුලත්ව මාසිකව රු.9000/- ක උපරිමයකට යටත්ව එක් රැස්වීමක් සඳහා රු3,000/- බැගින් දීමනාවක් ලබාගත හැක.

III. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවීම වෙනුවෙන් තමන් විසින් පොදු වාහන වලින් ගමන් කිරීම සඳහා වැය කරන මුදල ගමන් වියදම් වශයෙන් ලබාගත හැක.

IV. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දීමනා ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් අවම වශයෙන් පැය 2 ක කාලයක් පවත්නා තිබිය යුතුය.

## 02. අනුකමිටු දීමනා

i. සමිතියේ කාරක නියෝග අනුව ස්ථාපිත අනුකමිටු සඳහා පත්වන සභාපති/උපසභාපති හෝ අධ්‍යක්ෂවරුන් සඳහා රැස්වන එක් දිනකට රු.500/- බැගින් සහභාගිත්ව දීමනාවක් ලබාගත හැක.

ii. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවීම වෙනුවෙන් තමන් විසින් පොදු වාහන වලින් ගමන් කිරීම සඳහා වැය කරන මුදල ගමන් වියදම් වශයෙන් ලබාගත හැක.

**03. මහසභා රැස්වීම් සඳහා දීමනාව**

සමිතියේ මහසභා රැස්වීමකට සහභාගි වන මහ මහා නියෝජිතයෙකුට රු.1000/-ක උපරිමයකට යටත්ව දීමනාවක් ලබාගත හැකිය.

**04.සංයුක්ත දීමනාව**

i. සමිතියේ කටයුතු සඳහා පැය 06 කට නොඅඩු කාලයක් සඳහා නිරතවීම වෙනුවෙන් රු.250/-ක සංයුක්ත දීමනාවක් ලබාගත හැකිය.

ii. සමිතියේ කටයුතු සඳහා පැය 12 කට නොඅඩු කාලයක් නිරතවීම වෙනුවෙන් රු.500/- කට නොවැඩි සංයුක්ත දිමනාවක් ලබාගත හැකිය. මෙයට අමතරව රාත්‍රී නවාතැන් වෙනුවෙන් 25% ක දීමනාව ලබා ගැනීමකට හිමිකම් ඇත.

iii. ඉහත 1 හා 2 වගන්ති යටතේ දීමනා ලබා ගන්නා අවස්ථාවල මෙම දීමනාව ලබා ගැනිමට හැකියාව නොමැත.

**05.** සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල වල රැස්වීම් වලට සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරියාගේ වගකීමේ ස්වභාවයද, එවැනි රැස්වීම් වලට සහභාගි වීමේ වැදගත්කමද සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීමේ දීමනාව දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සමිතිය භාර ප්‍රධාන සංවර්ධන නිලධාරියාට පමණක් ලබාගැනීමට හිමිකම් ඇත. ඒ අනුව ඉහත 1(I) වගන්තියේ සඳහන් දීමනාව ලබා ගැනිමට හැකියාව ඇත.

**06.**මෙම චක්‍ර ලේඛනය මිලගට පවත්වන පළමු මහසභා රුැස්වීමකට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු අතර දැනට මහ සභා සක්‍රිය නොමැති සමිති සඳහා මහ සභා ආවරණ අනුමැතියට යටත්ව මෙම දීමනාව මාස 6 ක කාලයක් සඳහා පමණක් ලබාගත හැකිය.

**07.**මෙම චක්‍රලේඛය සී/ස කොළඹ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, සී/ස කළුතර දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, සී/ස ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, සී/ස දුනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය, සී/ස අත්තනගල්ල මීරිගම සහ ගම්පහ මැතිවරණ කොට්ඨාශයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය, සී/ස ගම්පහ සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය,සී/ස මුංවත්ත බටහිර සමුපකාර බැංකු සමිතිය, සී/ස ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතිය, සී/ස මීරිගම පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස මරදගහමුල පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස වේයන්ගොඩ පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස දෙල්මැල්ල තරුණ ගොවි ජනපද විවිධ සේවා සමුපකාර සමිතිය යන සමිති වලටද අදාල වේ.

එම්.ඒ.පී. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්
බස්නාහිර පළාත.

පිටපත් :

i. ලේකම් ,සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය - කරු.දැ.පි.

ii. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ,ගම්පහ,කළුතර) - කරු.දැ.පි.හා අදාළ නිළධාරීන් හා දිස්ත්‍රික්කයේ සියළු සමුපකාර සමිති දැන්වත් කිරීමට